# අම්බලන්තොට ප්‍රාදේශීය සභාව
# හම්බන්තොට දිස්ත්‍රික්කය

------------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 5 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 21 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දින වන විට සභාව විසින් පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු. 3,504,813 ක් සහ සමාලෝචිත වර්ෂයට අදාල රු. 118,043 ක වියදම් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුද්දර ගාස්තු තුළ 2012 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 287,850 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඇ) සභාව මගින් පවත්වාගෙන යනු ලබන ආයුර්වේදය සඳහා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ආධාර සහ පෞද්ගලික පරිත්‍යාග ලෙස එකතුව රු. 212,973 ක මුදලක් ලැබී තිබුනද, රු. 120,000 ක් පමණක් ආදායමට බැර කර තිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට පොදු ගබඩා ශේෂය රු. 686,204 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

## 1.3.2 බලය නොළත් ගනුදෙනු

දීර්ඝ කාලයක සිට වසා දමා ඇති කඩකාමර වලට අදාල එකතුව රු. 185,510 ක හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු ආදායම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබීමට පෙර මූල්‍ය ප්‍රකාශන වලින් කපාහැරීමට කටයුතුකර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 4,153,169 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම් ඉක්මවූ ආදායම රු. 6,458,658 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| i. | වරිපනම් හා බදු | 3,393 | 3,446 | 4,878 |
| ii. | බදු කුලී | 19,128 | 17,591 | 5,184 |
| iii. | බලපත්‍ර ගාස්තු | 2,411 | 2,161 | 591 |
| iv. | වෙනත් ආදායම් | 46,245 | 41,299 | 65,981 |

### 2.2.2 වරිපනම් බදු

වරිපනම් බදු වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට වු රු. 4,878,231 ක හිඟය අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.2.3 බදු කුලී

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට හිඟ කඩකුලී වටිනාකම වු රු. 61,245 ක් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ රජයේ තක්සේරුකරුගේ තක්සේරු වාර්තාව අනුව අම්බලන්තොට පොදු වෙළඳපොල කඩකාමර 123 ක තක්සේරු කල මුදල රු.753,000 ක් විය. 2012 මැයි 08 දින පවත්වන ලද මුදල් කාරක සභා රැස්වීම් අනුව කඩ කාමර කුලිය වු රු.457,200 ක් පදනම් කරගෙන අයකර තිබීමෙන් වාර්ෂිකව සභාවට අයවිය යුතු රු.295,800 ක මුදලක් අහිමි වි තිබුණි.

### 2.2.4 දැන්වීම් පුවරු ආදායම්

2014 දෙසැම්බර් 31 දිනට දැන්වීම් පුවරු ආදායම් ලෙස රු. 222,300 ක් අයවිය යුතු වුවද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (xxx) වගන්තිය ප්‍රකාරව එම හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.5 යන්ත්‍රෝපකරණ ආදායම්

සභාව විසින් කුලී පදනම මත ලබා දෙනු ලබන මෝටර් ග්‍රේඩරය, ලෝඩර් යන්ත්‍රය හා බැකෝ ලෝඩර් යන්ත්‍රයෙන් නිසි පරිදි කුලී මුදල් අයවී නොතිබූ අතර 2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 2,560,831 ක මුදලක් කුලී ලෙස අයවිය යුතුව තිබුණි. 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 5 (6) ප්‍රකාරව මෙම හිඟ ආදායම් අයකර ගැනීමට විධිමත් පියවර ගෙන නොතිබූ අතර මෙම හිඟ ආදායම තුළ ඉකුත් වර්ෂයන්ට අදාල රු. 451,433 ක හිඟ ආදායම්ද විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

**සෞඛ්‍ය පරිපාලක තනතුරට බඳවා ගැනීම**

-------------------------------------------------

2009 නොවැම්බර් 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 20/2009 ප්‍රකාරව 2009 නොවැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, සෞඛ්‍ය කම්කරු තනතුරේ සිටි අයකු සෞඛ්‍ය පරිපාලක තනතුරට බඳවා ගෙන තිබුණි. එම තනතුරේ පරිවාස කාලය සම්පූර්ණ වී ස්ථිර කිරීමේදී ප්‍රතිඵල සනාථ කර ගැනීමට විභාග දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිඵල සහතික යවා තිබූ අතර 2014 මැයි 21 දින ලද සනාථ කිරීම් අනුව සෞඛ්‍ය පරිපාලක තනතුරට සම්පූර්ණ විය යුතු සුදුසුකම් නොමැති බවත් ඔහු විසින් ආයතනයට ලබාදී තිබූ විභාග ප්‍රතිඵල සහතික සත්‍ය පිටපත් නොවන බවත් තහවුරු කරගෙන තිබියදී 2014 ජුනි මස සිට 2015 ජනවාරි මස දක්වා මාස 08 ක් සඳහා එකතුව රු. 200,772 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. 2015 පෙබරවාරි 01 දින සිට මෙම පුද්ගලයාගේ සේවය අත්හිටුවා තිබූ අතර එදිනට ඔහුගෙන් සභාවට අයවිය යුතු ආපදා ණය ශේෂය රු. 23,350 ක් 2015 මාර්තු 26 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

### 3.2 අවිධිමත් ගනුදෙනු

----------------------

සභාවේ සභිකයින් විසින් බාහිර පාර්ශවයන්ගෙන් යන්ත්‍රෝපකරණ ලබාගෙන සභා බල ප්‍රදේශයේ මාර්ග සංවර්ධන කටයුතු ඉටු කිරීම සඳහා ඉන්ධන ලීටර් 2002 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.243,043 ක මුදලක් වැයකර තිබුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 219(1) වගන්තිය ප්‍රකාර යම් ප්‍රාදේශීය සභාවක කිසිම සභිකයෙකුට හෝ සේවකයකුට ප්‍රාදේශීය සභාව සමඟ ඇතිකරන ලද හෝ ක්‍රියාවේ යොදවන ලද යම් ගිවිසුමක හෝ වැඩයක සම්බන්ධතාවයක් හෝ මූල්‍ය සම්බන්ධතාවක් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් නොතිබිය යුතු වුවත් එයට පටහැනිව මෙම ඉන්ධන ප්‍රමාණයට අදාල ඇනවුම් සභිකයන් විසින් අත්සන් කර භාර ගැනීම සිදුකර තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහාමාර්ග,වරාය හා නාවික අමාත්‍යාංශ ලේකම්වරයාගේ 2014 ජුලි 02 දිනැති අංක MPH/HYW/MNG/ Cer/14-1 දරන ලිපියේ 01 ඡේදය අනුව මහනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන මාර්ග සඳහා අමුද්‍රව්‍ය ප්‍රවාහනය

කිරීමේදී අමුද්‍රව්‍ය මත එකතු කරනු ලබන සියයට 10 ක අමතර පිරිවැය එකතු නොකර ඇස්තමේන්තු සකස් කරන ලෙස දක්වා තිබුණද 2014 ජුලි 02 දිනෙන් පසුව සභාව විසින් ගිවිසුම් අත්සන්කර ක්‍රියාත්මකකරතිබූ කර්මාන්ත 32 ක් සඳහා එසේ කටයුතු නොකිරීම නිසා එකතුව රු. 240,612 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(ආ) සභාව විසින් ක්‍රියාත්මකකරතිබූ කර්මාන්ත 06 ක් සඳහා එම මාර්ග වල පාදම සඳහා සහ ගල්කැට මතුපිට ගල් කුඩු ඇතිරීම වෙනුවෙන් අවශ්‍ය ප්‍රමාණයට වඩා ගල්කුඩු මිලදී ගෙන තිබීම නිසා එකතුව රු. 112,285 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) සභාව විසින් ක්‍රියාත්මකකර තිබූ කර්මාන්ත 06 ක එම මාර්ග දෙපස ඉදිකර තිබූ කොන්ක්‍රීට් ගැටි සඳහා හැඩයම් වැඩ යෙදීමේදී කොන්ක්‍රීට් ගැටි වල හතර පැත්ත සඳහාම හැඩයම් වැඩ යෙදූ බව දක්වමින් ගෙවීම් කර තිබුණද හැඩයම් වැඩ යොදා තිබුණේ කොන්ක්‍රීට් ගැටිවල පැති දෙකක් සඳහා පමණි. ඒ අනුව මෙම කර්මාන්ත 06 සඳහා පැති දෙකක් වෙනුවෙන් රු. 87,246 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

## 4. පද්ධති හා පාලනය

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය